පොලිස් වාර්තාවන්ට අනුව 2019 වසරේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ දිවි අහිමි කරගැනීම් සංඛ්‍යාව 3,135 කි. එය සාමාන්‍යයක් ලෙසින් ගතහොත් දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 කි. එසේම ලෝකයේම දිවි අහිමි කරගැනීම් දත්ත දෙස බැලුවහොත්, සෑම තත්පර 40 කටම වරක් පුද්ගලයෙකු දිවි අහිමි කරගනී. මෙය සමාජ ගැටළුවක් වන බැවින් දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් මාධ්‍ය විසින් වාර්තා කිරීම යුතු වුවත්, එහිදී දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් උපරිමයෙන් පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ.

පහත දැක්වෙන පුවත් වාර්තාවන් ඊට උදාහරණයකි. දිවි අහිමි කරගැනීමට පාදක වූ කරුණු සරලව නොදැක්විය යුතු යැයි එම ආචාර ධර්මයන්හි කියැවෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් පැවතිය හැකි නිසායි. එසේම දිවි අහිමි කරගත් ආකාරය පළ නොකළ යුතු යැයි කියැවෙන්නේ, ඒ ඔස්සේ තවත් අයෙකු එම ආකාරය භාවිතා කොට දිවි අහිමි කරගැනීමට නැඹුරු වීමේ හැකියාවක් ඇති නිසායි. එසේම උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු ඊට යොමු කිරීම ඔස්සේ එම ජීවිතය බේරාගැනීමට අවකාශයක් ලැබිය හැකිවේ.

දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීමේදී උපරිම ප්‍රවේසමක් සහ ආචාර ධාර්මික ප්‍රවේශයක් අවශ්‍ය වන්නේ එනිසායි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138
https://ourworldindata.org/suicide
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://accountablejournalism.org/.../australia-standards...

**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Ada #Lankadeepa**